සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
**இறுதி தவணைப் பரீட்சை - 2024 (2025) / Year End Term Test - 2024 (2025)**

ශ්‍රේණිය / தரம் / Grade : 9 ශ්‍රේණිය

**ඉතිහාසය I, II**

කාලය / நேரம் / Time : පැය 2 යි

නම / பெயர் / Name ..........................................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ............................................

**I කොටස**

- **මෙම කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න**
- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු වරහන් තුලින් තෝරා හිස්තැන මත ලියන්න**

01. ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය වූයේ ............................................... යි. (ගෝව/ බතාවිය )

02. පෘතුගීසීන් මෙරටින් පන්නා දැමීමට ලන්දේසීන්ගේ සහාය ..................................................... රජතුමා ලබා ගත්තේය. (දෙවන රාජසිංහ/ පලමු වන රාජසිංහ)

03. මුල් කාලයේ ස්වභාවිකව වැවෙන................................................. සඳහා ආර්ථික වටිනාකමක් දෙනු ලැබුවේ ලන්දේසීන් විසිනි. (කුරුඳු /කෝපි)

04. කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පති වී එහි දියුණුවට කටයුතු කරන ලද්දේ................................................. මහතාය. (ටී.බී. ජයා/ සිද්දි ලෙබ්බේ)

05. චම්පරන් ව්‍යාපාරය, ඛේඩා ව්‍යාපාරය, ඉංග්‍රීසීන් ඉන්දියාවෙන් පිට වෙනු මෙවැනි ව්‍යාපාර වලට නායකත්වය දුන් ඉන්දියානු නායකයා .............................................................. ය. (ජවහර්ලාල් නේරු/ මහත්මා ගාන්ධි)

- **අංක0 6 සිට 10 දක්වා ඇති වගන්ති හරි නම් (✓) ලකුණද වැරදි නම් (X) ලකුණද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

06. ඉංග්‍රීසීන්ට ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය ඉතා වැදගත් වරායක් විය. ( )

07. ක්‍රිස්තු වර්ෂ 1848 නිදහස් සටනට නායකත්වය දෙන ලද්දේ කැප්පෙටිපොළ නිලමේ විසිනි. ( )

08. ශ්‍රී ලංකාවේ පොල් පර්යේෂණ ආයතනය ලුණුවිල පිහිටා ඇත. ( )

09. ජලියන්වලා බාග් ඛේදවාචකය 1920 වර්ෂයේ ඉන්දියාවේ සිදුවූවකි. ( )

10. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා පොන්නම්බලම් රාමනාදන් මහතාය. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 20 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය යටතේ පංචමහාවාද පැවැත්වීමට මූලිකත්වය ගත්තේ

I. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
II. පූජ්‍ය වස්කඩුවේ සුභූති හිමි
III. පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
IV. පූජ්‍ය රත්මලානේ ධම්මාලෝක හිමි

12. ඉන්දියාවේ මුගල් අධිරාජ්‍යය පරිහානියට පත් වූයේ කිනම් පාලකයාගේ කාලයේදීද ?

I. මහා අක්බර් රජු II. ෂා ජහන් රජු III. ජහන්ගීර් රජු IV. ඖරංසෙබ් රජු

13. බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ආදායම් තත්ත්වය ඉහළ නැංවීම සඳහා කරන ලද යෝජනා අතුරින් වතු වගාවේ උන්නතියට බලපෑ යෝජනාව කුමක්ද?

I. උඩරට හා පහතරට ඒකාබද්ධ කර පාලනය කිරීම II. රජයේ ඇතැම් දෙපාර්තමේන්තු වසා දැමීම

III. අධිකරණ පද්ධතියක් පිහිටුවීම IV. රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම

14. ක්‍රිස්තු වර්ෂ 1815 ඉංග්‍රීසීන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සැකසූ රාජ්‍ය නිලධාරියා කවුරුන්ද?

I. ජෝන් ඩොයිලි II. මුත්තුසාමි III. මැක්ඩොවල් සෙනවි IV. ෆෙඩ්රික්නෝත්

15. බ්‍රිතාන්‍ය යටත් විජිත අතරින් ඡන්ද බලය හිමිකරගත් ප්‍රථම ආසියාතික රට කුමක්ද?

I. ඉන්දියාව II. ශ්‍රී ලංකාව III. පාකිස්ථානය IV. බංග්ලාදේශය

16. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ආණ්ඩුකාර ධූරය අහෝසි කොට අග්‍රාණ්ඩුකාර ධූරය ස්ථාපිත කරන ලද්දේ කිනම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ද?

I. ක්‍රිස්තු වර්ෂය 1833 කෝල් බෲක් ප්‍රතිසංස්කරණ ය II. ක්‍රිස්තු වර්ෂ 1920 මැනිං ප්‍රතිසංස්කරණ ය

III. ක්‍රිස්තු වර්ෂ 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ය IV. ක්‍රිස්තු වර්ෂ 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණ ය

17. නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිතුමා වූයේ කවුරුන්ද?

I. එස්.ඩබ් .ආර්.ඩී බණ්ඩාරනායක මහතා II. ඩී. එස්. සේනානායක මහතා

III. ඩඩ්ලි සේනානායක මහතා IV. ජේ.ආර්. ජයවර්ධන මහතා

18. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු සංඛ්‍යාව කොපමණද?

I. 196 කි II. 168 කි III. 225 කි IV. 200 කි

19. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා ගොවිජනපද ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ

I. ඩී.එස්.සේනානායක මහතා II. ජේ.ආර් .ජයවර්ධන මහතා

III. ගාමිණී දිසානායක මහතා IV. ඒ. අමිර්තලිංගම් මහතා

20. ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය පහත සඳහන් ආයතන වලින් කුමක්ද?

I. මහාධිකරණය II. අභියාචනාධිකරණය

III. දිසා අධිකරණය IV. ශ්‍රේෂ්ඨාධිකරණය

( ලකුණු 2 X 20 = 40 )

## II කොටස

- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01. (අ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ දක්වා ඇති අක්ෂරවලට අදාල නම් පහත ලැයිස්තුවෙන් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

1. යාපනය
2. කල්පිටිය
3. මීගමුව
4. මඩකලපුව
5. පොළොන්නරුව
6. සෙංකඩගල




( ලකුණු 06 )

(ආ) I. 1. පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

2. මෙතුමා විසින් ආරම්භ කරන ලද දේශපාලන පක්ෂය කුමක්ද?

3. 1956 මහ මැතිවරණයේදී මෙතුමාට සහාය දුන් බලවේගය කුමක්ද?



(ලකුණු 03)

II. 1. රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2. මෙය නිර්මාණය කළේ කවුරුන් විසින්ද ?

3. මෙය පිහිටා ඇති නගරය කුමක්ද?



(ලකුණු 03)

02. i. පහත සඳහන් සිද්ධීන්ට සම්බන්ධ පුද්ගලයින් වරහන් තුළින් තෝරා පිළිවෙලින් ලියා දක්වන්න.

A." ඉඟුරු දී මිරිස් ගත්තා" යන ප්‍රස්ථාව පිරුළ හා සම්බන්ධ රජතුමා.

B. ක්‍රිස්තු වර්ෂ 1766 දී උඩරට රජු සමඟ ගිවිසුමක් අත්සන් කළ ලන්දේසි ආණ්ඩුකාරවරයා.

C. 1796 දී ලංකාවේ වෙරළ තීරය බ්‍රිතාන්‍යයන්ට අයත් වූ සමයේ උඩරට පාලනය කළ රජතුමා.

(කීර්ති ශ්‍රී රාජසිංහ, බැරන් වැන් එක්, රාජාධිරාජසිංහ, විලියම් ෆැලක්, දෙවන රාජසිංහ ) (ලකුණු 03)

ii. පහත සඳහන් උඩරට රජවරුන්ගේ පාලන සමයේ ලංකාවට පැමිණි ලන්දේසි දූත කණ්ඩායම්වල නායකයින් පිළිවෙලින් නම් කරන්න.

A. පළමුවන විමලධර්මසූරිය රජු
B. දෙවන රාජසිංහ රජු
C. දෙවන විමලධර්මසූරිය රජු
D. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ලකුණු 04)

iii. ආනයන වියදම් අඩුකර ගැනීම සඳහා මෙන්ම අමතර ආදායම් ලබා ගැනීමේ අරමුණින් ලන්දේසීන් කටයුතු කළ ආකාරය නිදසුන් තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

03. i. බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

ii. බ්‍රිතාන්‍යයන්ට එරෙහිව ඇති වූ 1818 සටනට තුඩුදුන් හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. බ්‍රිතාන්‍ය පාලන සමයේ

A. කෝපි වගාව දියුණුවීමට බලපෑ හේතු තුනක් හා

B. ක්‍රිස්තු වර්ෂ 1848න් පසු කෝපි වගාවේ පරිහානියට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

04. i. 19 වන සියවස මුල් භාගයේ දී ශ්‍රී ලංකාවට පැමිණි මිෂනාරි සංවිධාන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

ii. ජාතික පුනර්ජීවන සමයේ පහත සඳහන් පාසල් ගොඩනැගීමට පුරෝගාමී වූ පුද්ගලයන් ලියා දක්වන්න.

A. කොළඹ සහිරා විද්‍යාලය
B. ශිවන්ගල විද්‍යාලය
C. පරමේශ්වර විද්‍යාලය
D. කොළඹ ආනන්ද විද්‍යාලය (ලකුණු 04)

iii. ජාතික පුනර්ජීවන ව්‍යාපාර සමයේ

A හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගෙන් ඉටු වූ සේවාවන් දෙකක්

B ආරුමුග නාවලර්තුමාගෙන් ඉටු වූ සේවාවන් දෙකක් සහ

C සිද්දි ලෙබ්බෙ මහතාගෙන් සිදුවූ සේවාවක් සඳහන් කරන්න. (ලකුණු 05)

05. i. ඉන්දීය ජාතික ව්‍යාපාරයේ පහත සඳහන් සිද්ධි හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා ලියා දක්වන්න.

A ඉංග්‍රීසි හමුදා නිලධාරියෙකුට වෙඩි තැබූ සිපෝයි භටයා
B ඉන්දියානු ආගමික පුනරුදයට අඩිතාලම දැමූ පඬිවරයා
C පාකිස්ථානය යනුවෙන් වෙනම රටක් පිහිටුවා ගැනීමට කටයුතු කළ පුද්ගලයා

(බහදූර් ෂා, අලිජින්නා , මංගල් පණ්ඩේ, රාම්මෝහන් රෝයි, සී. ආර්. දාස්, මහත්මා ගාන්ධි ) (ලකුණු 03)

ii. ක්‍රිස්තුවර්ෂ 1857 සිපොයි කැරැල්ල ඇති වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ඉන්දියානු ජාතික සංගමය පිහිට වූ මුල් කාලයේ

A ආණ්ඩුව වෙත ඉදිරිපත් කළ ඉල්ලීම් දෙකක් සහ

B ඉන්දියානු දේශපාලනයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

06. i. පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වැදගත්වන පුද්ගලයන් නම් කරන්න

A ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය

B මෙරට ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා

C මෙරට ප්‍රථම කථානායකවරයා (ලකුණු 03)

ii. ක්‍රිස්තු වර්ෂ 1865 දී ලංකා සංගමය පිහිටුවීමට මූලිකත්වය ගත් පුද්ගලයන් දෙදෙනා නම් කරන්න. (ලකුණු04)

iii. A ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ පහත සඳහන් සභාපතිවරු දෙදෙනාගේ ප්‍රධානත්වයෙන් පිහිට වූ විධායක කාරක සභා දෙක දක්වන්න

1. ඩී.එස්.සේනානායක මහතා
2. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා

B සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. i. ක්‍රිස්තු වර්ෂ 1978 දී පිහිටුවන ලද පාර්ලිමේන්තුවට අයත් කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

ii. A ක්‍රිස්තු වර්ෂ 1956 මැතිවරණයෙන් පිහිටවූ ආණ්ඩුවේ වැඩපිළිවෙළවල් දෙකක් හා

B ක්‍රිස්තු වර්ෂ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට හිමිවී ඇති විධායක බලතල දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. නිදහසින් පසු අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව පිණිස රජය විසින් ගන්නා ලද පියවර තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න (ලකුණු 05)

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**තෙවන වාර පරීක්ෂණය - 2024**

**ඉතිහාසය -9 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

I කොටස

1. බතාවිය
2. දෙවන රාජසිංහ
3. කුරුඳු
4. ටී.බී ජයා
5. මහත්මා ගාන්ධි
6. √
7. X
8. √
9. √
10. X
11. පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
12. ඖරංසෙබ්
13. රජයේ ඉඩම් විකිනීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
14. ජෝන් ඩොයිලි
15. ශ්‍රී ලංකාව
16. ක්‍රි.ව .1947 සෝල්බරී ප්‍රතිසංස්කරණය
17. ඩී.එස්.සේනානායක මහතා
18. 225 කි
19. ඩී.එස්.සේනානායක මහතා
20. ශ්‍රේෂ්ඨාධිකරණය

පිළිතුරු 11 පත්‍රය

1.අ.




ආ.1.

1 .එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මයා

11.ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

111. පංච මහා බලවේගය

11.

1. ටජ් මහල

11.සාජහාන් රජතුමා

111.අග්‍රා නගරය

02. 1. A.දෙවන රාජසිංහ රජු

B. කීර්ති ශ්‍රී රාජසිංහ රජු

C. රාජාධි රාජසිංහ

11. A.ජොරිස් වැන් ස්පිල්බර්ජන්

B.ජෙරාඞ් හලන්ට්

C.කලන් අල්බස්

D. කෝර්නේලියස් මැකල්

111. * . මුතුරාජවෙල අස්වැද්දීම

* .යෝධ වැව හා කන්තලේ වැව ප්‍රතිසංස්කරණය කිරීම මඟින් වී නිශ්පාදනය වැඩි කිරීමට උත්සාහ කිරීම.

*. උක්,ගම්මිරිස් එන්සාල් , කෝපි, මල්බෙරි, ඉන්ඩිගෝ වගාවන් දියුණු කිරීම

*. හැමිල්ටන් ඇළ ඉදිකොට භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනීම .

*.යාපනය ප්‍ර දේශයේ දුම්කොළ වගා කිරීම හා තල් ගස් කඳන් අපනයනය කිරීම .

03. 1.

1. ශ්‍රී.ලංකාවේ පිහිටීම

11.ත්‍රිකුණාමල වරායේ වැදගත්කම

111.වෙළඳ කටයුතුවල ඇති වැදගත්කම

11. *. රජෙකු නොමැතිවීම නිසා ජනතාව තුළ ඇති වූ කල කිරීම

*. බ්‍රිතානය පාලනය යටතේ බුදු දහම විනාශ වෙතැයි බිය වීම

* . දේශීය සාම්ප්‍රදායන් , සිරිත් විරිත් , නොසලකා ඉංග්‍රීසින් සිදු කළ පරිපාලන හා නීති ප්‍රතිසංස්කරණ නිසා ජන ජීවිතය වියවුල් වීම

*. රඳල ප්‍රධානින්ගේ බල තල වරප්‍රසාද හා ආදායම් මාර්ග සුරක්ෂිත නොවීම.

*.වෙල්ලස්සේ මඩිහෙ මුහම්දිරම් තනතුරට හජ්ජි මරික්කාර් පත් කිරීම

111. A .*. විශාල වශයෙන් ලාබ ලැබීමට හැකි වීම .

*. අඩු වියදමකින් උසස් තත්වයේ කෝපි වගා කිරීමට හැකි විම

*. විශාල ප්‍රමානයේ කෝපි වතු ආරම්භ කිරීම .

*. මෙරටින් එංගලන්තයට අපනයනය කළ කෝපිවලට තීරු බදු අය කිරීම

B.

*.ජාවා වැනි අග්නිදිග ආසියානු රටවලින් යුරෝපීය වෙළඳපොළට කෝපි අපනයනය කිරීම නිසා ලංකාවේ කෝපිවලට ඉල්ලුම අඩු වීම

* . 1948 පසු ඇති වූ ලෝක ආර්ථික පරිහානිය 1869න් පසු හෙමලියා යෙස්ටර්ට්‍රික්ස් දිලීර රෝගය වැළදීම .

04. 1.බැප්ටිස් ට්, වර්ච්, වෙස්ලියන් ,ලන්ඩන්, ඇමරිකන්

11. A. සිද්ධිලෙබ්බෙ මහතා

B.ආරුමුගම් නාවලර්තුමා

C. පොන්නම්බලන් රාමනාදන්

D. හෙන්රි ස්ටිල් ඕල්කට්තුමා

111. A . *. බෞද්ධ පාසල් අරමුදලක් පිහිටුවීම

*. ඉරු දින දහම් පාසල් ඇරඹීම

*. වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් කිරීම.

*. බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම

B. *. හින්දු ආගමික පුනරුදයට නායකත්වය දීම

*. හින්දු භාෂාව ,සාහිත්‍ය හා සංස්කෘතිය රැක ගැනීමට ක්‍රියා කිරීම.

*. පොත්පත් රචනා කිරීම .

C. *.ඉස්ලාම් පුනරුදයට නායකත්වය දීම

*. මුස්ලිම් නෙයිසාර සගරාව ඇරඹීම

*. සහිරා විද්‍යාල පිහිටු විම

05. 1. . A .මංගල පාන්ඩෙ

B. රාම් මොහාන් රෝයි

C. අල්ජින්නා

11.*. ඉංග්‍රීසින් ඉංදියානු ප්‍රදේශ අත්පත්කර ගැනීමේදී අනුගමනය කළ ප්‍රතිපත්තිය කෙරෙහි ඉන්දියානුවන් තුල පැවැති විරෝධය

*. ඉංග්‍රීසි වෙළඳ සමාගමේ වාසි තකා ගෙන ගිය පාලනය පිළිබඳ ඉන්දියානුවන් තුළ පැවැති කල කිරීම.

*. වෙළඳ සමාගමේ ආර්ථික ප්‍රතිපත්ති නිසා දේශිය කර්මාන්ත අභාවයට යාම රැකියා හිඟ වීම

* ස්වදේශිකයන්ගේ ඇඳහිලි , විශ්වාස නොසලකා හැරීම.

* .ක්‍රිස්තියානි ආගම පැතිරවීම .

*.ඩිපෝයි භටයන් තුළ ඉංග්‍රීසින් කෙරෙහි පැවැති කලකිරීම.

111. A.*. ව්‍යවස්ථාදායක සභාව පුළුල් කොට එහි බලතල වැඩි කිරීම.

* . විධායක සභා නියෝජනයට ඉන්දියානුවන්ට අවස්තාව ලබා දීම .

*. සිවිල් සේවය ටබඳවා ගැනීමේ විභාග ඉංදියාව තුළ පැවැත්වීම

* යුද්ධ හමුදා කටයුතු සඳහා රජය දරන වියදම අඩු කිරීම .

B. * ඉංදියාවට නිදහස ඉල්ලා කරන උද්ඝෝෂණ ඉතා තියුණු මට්ටමකට පැමිණීම .

*. ඉංදියාව තව දුරටත් යටත් විජිතයක් ලෙස පවත්වා ගෙන යාමට නොහැකි බව බ්‍රිතාන්‍ය තේරුම් ගැනීම

* . බ්‍රිතාන්‍ය රජය ඉංදියානු නායකයන් හා සාකච්ඡා කරමින් නිදහස ලබා දීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරිම.

*. මොහොමඩ් අලජින්නාගේ නායකත්වය යටතේ මුස්ලිම් ලීගය පාකිස්ථානය යනුවෙන් රටක් පිහිටුවා ගැනීම

06.1. A .සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය

B. හෙන්රි මන්ක් මේසන් මූවර්

C. ඒ.එෆ්.මොලමුරේ මහතා

11.*. විලියම් ඩිග්බි

*. ජෝජ් වෝල්

111. A 1. කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ කාරක සභාව

11. අධ්‍යාපනය පිලිබඳ කාරක සභාව

B.*. ආණ්ඩුකාර ධූරය අහෝසි කොට ආණ්ඩුකාර ධූරයක් ස්ථාපිත කිරීම

*. ද්වි මන්ඩල පාර්ලිමේන්තුව පිහිටු වීම .

*. අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය ඇති කිරීම.

*. රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

07. 1. *. නීති සම්පාදනය කිරීම

*.මූල්‍ය පාලනය කිරීම

*. ජනාධිපති වරයාට විරුද්දව දෝෂාභියෝග ඉදිරිපත් කිරීම

මහජන දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම

11. A. *.දේශීය කර්මාන්ත හා ගොවිතැන් කටයුතු දියුණු කිරීමට පියවර ගැනීම .

*. වරාය හා බස් ජනසතු ව්‍යාපාර ඇතුළු ජනසතු ව්‍යාපාර ආරම්භ කිරීම .

*. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම .

B . *. අගමැතිවරයා පත් කිරීම .

*. අමාත්‍ය මණ්ඩලය පත් කිරීම හා විෂය හා කාර්යන් පැවරීම

*. රජයේ උසස් නිලධාරින් පත් කිරීම .

*.අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම